# පුරවැසි සටහන්

# ජනාධිපති ජනමාධ්‍ය

**සුනන්ද දේශප්‍රිය**
05.07.2007

අසව්, අසව්, ජනාධිපතිතුමා රාජ්‍ය මාධ්‍ය නිර්- දේශපාලනික් කිරීමට තීරණය කර තිබේ. ජන මාධ්‍ය ආචාර ධර්මීය ලෙස කටයුතු කළ යුතු බවද ජනාධිපතිතුමා තීරණය කරයි.

ඒ රාජ්‍ය ජනමාධ්‍ය වාර්තාවකි.

තවත් වාක්‍යයක් තිබේ. එනම් රටේ තත්ත්වය ප්‍රක්ෂේපනය කිරීමට රජයට අයත් ජනමාධ්‍ය වඩා හොඳින් කටයුතු කළ යුතු බව යි.

ප්‍රක්ෂේපනය කළ යුතු රටේ තත්ත්වය නිර්වචනය කිරීමේ අයිතිය ඇත්තේ ජනමාධ්‍ය ආචාර ධර්ම අනුව ජනමාධ්‍යවේදීන්ට ය. මන්ද යත් දේශපාලනඥයන් විසින් රටේ තත්ත්වය නිර්වචනය කරන්නේ තමන්ට අවශ්‍ය පරිදි නිසා ය. එහිලා රනිල් වුවත් විමල් වුවත් මහින්ද වුවත් වෙනසක් නැත.

ජනමාධ්‍යවේදීන් වන අප වගකීම ඇත්තේ දේශපාලනඥයින්ට නොව පුරවැසියාට ය. අපේ පළමු බැඳීම සත්‍ය ය සහ නිවැරදි වාර්තාකරණයට යි. පුවතක් නිවැරදි වන්නේ එ සත්‍ය වූ පමණින් නොව සාධාරණ ද වූ විට ය. සෑම පැත්තක්ම ආවරණය වූ විට ය.

රාජ්‍ය පාලිත මාධ්‍ය ශ්‍රී ලංකාවේ වඩාම අගතිගාමී ජනමාධ්‍ය ය බව පෙන්වා ඇත්තේ එක් සමීක්ෂනයකින් පමණක් නොවේ. පසුගිය කාලයේ සිදු කෙරුණු සෑම සමීක්ෂනයක් ම වාගේ පෙන්වන්නේ අචාර ධර්මීය පැවැත්මක් නැති බලයට එන දේශපාලනඥයින්ට බැල මෙහෙවරේ යෙදෙන ජනමාධ්‍ය වන්නේ මෙම රාජ්‍ය ජනමාධ්‍ය බව යි.

දිනමිණ පුවත්පතෙහි කර්තෘව සිටි සී දොඩාවත්ත එම ධුරයෙන් පහ කැරුණේ ජනාධිපති මහින්ද රාජපක්ෂ ගේ උපන් දිනය වරදවා පළකිරීම නිසා ය. ඔබ්සෝවර් කර්තෘව සිටි රාජ්පාල් අබේනායක පහ කැරුණේ ජනාධිපති මහින්ද ගේ දේශනයක තැන් තැන් විවේචනය කළ නිසා ය. සුබසෙත නම් ලේක්හවුස් නක්ෂත්‍ර පුවත් පතෙහි කතුවරිය පහ කැරුණේ ජනාධිපති මහින්දට අවාසි යැයි පෙනෙන අනාවැකියක් පළ කළ නිසා ය. හතේ කනිසම වැඩසටහන සහ නාරද බක්මීවැව සහ වසන්ත දුක්ගන්නාරාළ ආණ්ඩුවේ රූපවාහිනියෙන් පළවා හැරුනේ කොන්ඩය බැඳ ජනාධිපති රාජපක්ෂ ගේ ගමෙහි සංදර්ශනයකට සහභාගි වූ නිසා ය. බන්දුල පත්ම කුමාර ලේක්හවුසියේ සභාපති කෙරුණේ ජනාධිපති මහින්ද ම කී ලෙස ඔහුගේ මිතුරෙකු වු නිසා ය. තවත් මිතුරන් ළග දී පත් කෙරුණු නොඅනුමාන ය.

රාජ්‍ය මාධ්‍ය බලයට පත්වන ආණ්ඩුවලට සිත්සේ යොදා ගත හැකි මෙවළමක් වී තිබෙන්නේ මෙරට නීතියේ පාලනයක් නැති නිසාත් දේශපාලනඥයින්ගේ අනිසි අධිකාරී බලයත් නීතියේ හිඩැසුත් නිසා ය.

ජනාධිපති කතාවකින් නියෝගයකින් එය විසඳෙන්නේ නැත. වෙනස් වන්නේ ද නැත. ඒ සඳහා නීතිමය රාමුවක් ද වෙනස් දේශපාලන සහ මාධ්‍ය සංස්කෘතියක් ද අවශ්‍ය ය. කතා වෙනුවට වැඩ අවශ්‍ය බව පැරණි වැඩකාරයකු වූ මහින්ද රාජපක්ෂට අප අලුතෙන් කියා දිය යුතු ද?

ජනාධිපති මහින්ද රාජපක්ෂ ට රාජ්‍ය මාධ්‍ය නිර්දේශපාලනීයකිරිමට සහ මාධ්‍ය නිදහසේ සංස්කෘතියක් ඇති කිරිමට අවශ්‍ය නම් ඔහු විසින් ගත යුතු  පියවර දැනටමත් පසුගිය ආණ්ඩු මගින් ලේඛන ගත කොට තිබේ:

- ව්‍යවස්ථා  සභාව යටතේ ස්වාධින ජනමාධ්‍ය කොමිසමක් පිහිටුවීම
- 1995 සිදත් ශ්‍රී නන්ද ලෝචන කමිටු වාර්තාව අනුව යමින් ලේක් හවුසියේ හිමිකාරකම පුළුල් කිරීම
- රාජ්‍ය විද්‍යුත් මාධ්‍ය ස්වාධීන කිරීම සඳහා ස්වාධින විකාශන අධිකාරිය පිහිටුවීම
- 2004 දෙසැම්බරයේ දී අමාත්‍ය මණ්ඩලය විසින් සම්මත කළ තොරතුරු නිදහසේ පනත නීතියක් බවට පැමිණ වීම

මෙම ප්‍රතිසංස්කරණයන්ගෙන් තොරව රාජ්‍ය මාධ්‍ය නිර් දේශපාලනීය කිරිමට පොරොන්දු දීම නැවත වරක් ජනමාධ්‍ය ප්‍රජාව මෙන්ම උනන්දුමත් පුරවැසි සමාජය කඩේ යැවීමක් පමණ ය.

බලයේ සිටින මහින්ද රාජපක්ෂට වුවත් බලයට ඒමට සිටින රනිල් වික්‍රමසිංහට වුවත් අප කිය සිටිය යුත්තේ මෙයයි. කතා එපා! නීති ප්‍රතිසංස්කරණ ඇති කරන්න කියා ය.

## දශ ලක්ෂ 2000ක් ජනාධිපතිට

බොහෝ දේශපාලනඥයින්ට වරදින්නේ කපටි උපදේශකයින් නිසා ය.  නැත්නම් මැස්සන් එලවීමට කඩුවෙන් කෙටූ මෝඩ වඳුරු ආරක්ෂකයින් නිසා ය.

මහින්ද රාජපක්ෂ මහතාට දෙවර්ගයෙන් ම අඩුවක් නැත. නොඑසේව මේ තරමට කකුළ කටේ දාගන්නේ නැත.

අමාත්‍ය මණ්ඩලයට සිය නමින් සාපරාධි අපහාස නීතිය යළි ගෙන ඒමට පත්‍රිකාවක් ඉදිරිපත් කර ඊළග දවසේ එවැනි නීතියක් ගෙන නොඑන බවට ශපථ කරන්නේ එනිසා ය.

රනිල් වික්‍රමසිංහ කළ දේශපාලන විග්‍රහයක්, එනම් මහින්ද රාජපක්ෂ හිට්ලර් ජර්මනිය විනාශ කළ පරිදි මෙරට විනාශ කරන්නට යන්නේ යැයි   පළ කිරිම වෙනුවෙන් පුවත්පතකින් රුපියල් බිලියන දෙකක වන්දියක් ඉල්ලා නඩු පවරන්නේ ද එනිසා ය. දේශපාලන විග්‍රහ නිදහස් ය. පළ නොකළ යුත්තේ පුද්ගලික අපහාසයන් ය. කැරණු විකෘති කිරීම් ය.

දේශපාලන විග්‍රහ ඒ ගනයට අයත් වන්නේ නැත. මහින්ද රාජපක්ෂ විසින් ම කරන ලද මෙවැනි දේශපාලන විග්‍රහ කොතෙක් ජනමාධ්‍ය වියින් පළකර ඇත් ද? සමහර විට මෙය ඔහු කෑ හොඳම ළණුවක් වීමට ඉඩ තිබේ.

කොළඹින් දෙමළ ජනයා බැහැර කිරීමට ආණ්ඩුව ගත් තිරණය ලොව පුරා දැඩි දෝෂ දර්ශනයට ලක් වෙත් දී ජීනිවාහි දීත් මෙරට දීත් එම තීරණය සාධාරණ කිරීමට කතා කරන්නේ ද එනිසා ය. ඔවුන්ගෙන් පිරිසක් ගියේ කැමැත්තෙන් යැයි ජනාධිපත් මහින්ද රාජපක්ෂ කියන්නේ උදෑසන 3.45ට පමණ නිදි ඇඳුම් පිටින් ම ඔවුන් ගෙන ගිය බව සාක්ෂි ඇතිව ඔප්පු වී තිබිය දී ය.

## දශ ලක්ෂයක උපදෙස්

ජනාධිපති  මහින්ද රාජපක්ෂ ගේ මාසික උපදෙස් වියදම දශලක්ෂයකට ආසන්න ය. ඔහුගේ උපදේශකයින් 25දෙනාගේ මාසික වැටුප රුපියල් 820,000 කි.  ඔහුගේ සම්බන්ධිකරණ

ලේකම්වරුන්ගේ මාසික වැටුප රුපියල් 246,410කි. ජංගම දුරකථන සහ ඉන්ධන දීමනා ඊට අමතරව ය.

වාසුදේව නානායක්කාර ද උපදේශකවරයකු වශයෙන් මාසිකව රුපියල් 60,000 ක් ලබා ගනී. ලක්ෂ්මන් ජයකොඩි, රොනී ද මැල්, සුනිමල් ප්‍රනාන්දු, ධම්මික අමරසිංහ සහ තවත් අය මාසිකව රුපියල් 60.000 බැගින් ලබා ගන්නේ එම දීමනාව නැත්නම් ඔවුන් හිඟමනට පත්විය හැකි නිසා විය හැකි ය.

අනේ කාලේ වනේ වාසේ!